මගේ අංකය : SG/Admin/CS/5/17 - Annual Transfer (Internal) - 2020,
ඒකාබද්ධ සේවා අංශය,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ - 05.

2019.05. 10 වෙනි දින.

සියලුම අතිරේක සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම පළාත් සර්වේයර් ජනරාල්වරුන්/අධ්‍යක්ෂ(මැ.සි.ආ.)/අධ්‍යක්ෂ (මුදල්)/ප්‍රධාන අභ්‍යන්තර විගණක,
සියලුම නියෝජ්‍ය සර්වේයර් ජනරාල්වරුන්,
සියලුම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිවරුන්/මිනින්දෝරු අධිකාරිවරුන්,
ප්‍රධාන කාර්මික හා පරිපාලන නිලධාරි/සිතියම් නිෂ්පාදන නිලධාරි,
කාර්මික හා පරිපාලන නිලධාරිවරුන්/පරිපාලන නිලධාරි,
ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශ ප්‍රධානීන්,

**ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් - 2020 ( දෙපාර්තමේන්තුව තුළ)**

ඒකාබද්ධ සේවාවන්හි සියලුම අභ්‍යන්තර වාර්ෂික ස්ථාන මාරුවීම් 2020 ජනවාරි මස පළමු වැනි දින සිට බල පැවැත්වෙන සේ ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් සේවාවන්වල නිලධාරීන්ගෙන් **2019.05.31 දින දක්වා** අයදුම්පත් භාර ගනු ලැබේ.

I. රජයේ භාෂා පරිවර්තක සේවය ( I පන්තිය )
II. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය ( 2, 3 පන්ති )
III. සංවර්ධන නිලධාරී සේවය ( III / II / I ශ්‍රේණි )
IV. රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය ( III / II / I ශ්‍රේණි )
V. ඒකාබද්ධ රියදුරු සේවය ( III / II / I, විශේෂ ශ්‍රේණි )
VI. කාර්යාල සේවක සේවය ( III / II / I, විශේෂ ශ්‍රේණි )

02. අභ්‍යන්තර ස්ථාන මාරු අයදුම් කරනු ලබන නිලධාරීන් අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කළ **අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය**. නියමිත ආකෘතිපත්‍රයට අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් හා 2019.05.31 දිනෙන් පසුව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කාරුණිකව දන්වමි.

04. අභ්‍යන්තර ස්ථාන මාරු වීම් සඳහා ඉල්ලුම් කරන නිලධාරීන්ගේ සුදුසුකම් තීරණය කිරීමේ දී පහත ප්‍රතිපත්ති පොදුවේ උපයෝගී කර ගනු ලැබේ.

04.1 2019 දෙසැම්බර් 31 දින වන විට

(අ) තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 02 ක් සේවය කරන ලද නිලධරයන් වාර්ෂික ස්ථාන මාරු වීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

(ආ) එකම සේවා ස්ථානයක වසර 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් ස්ථාන මාරුවීම්වලට යටත් වන්නේය.

(ඇ) මීට අමතරව දෙපාර්තමේන්තුවෙහි පරිපාලන අවශ්‍යතාවය මත නිලධාරීන් අභ්‍යන්තර ස්ථාන මාරු කිරීම් සඳහා යටත් වේ.

04.2 සේවා ස්ථානයක අවුරුදු 02 කට අඩු සේවා කාලයක් ඇති නිලධාරීන් ස්ථාන මාරුවීමක් ඉල්ලන්නේ නම්, ඔහුට / ඇයට සේවා අවශ්‍යතාවන්ට අනුකූලව එවැනි ස්ථාන මාරුවීමක් ලබා දිය හැකිය.

(අ) ස්ථාන මාරුවීමක් ලැබීමට සුදුසුකම් ලබන නිලධාරියෙකුට ස්ථාන මාරුවීමක් දීමට සිදුවන අවස්ථාවක දී එම ස්ථානයේ වැඩිම සේවා කාලය ඇති නිලධාරියාගේ සිට අවරෝහණ පිළිවෙලින් 04:1 (ආ) ඡේදයේ අවශ්‍යතා සම්පූර්ණ නිලධාරීන් පමණක් එම ස්ථානයෙන් පිටතට ඇයගේ / ඔහුගේ ඉල්ලීමක් රහිතව ද මාරු කළ හැකිය.

(ආ) යම් සේවා ස්ථානයක් වෙත ඉල්ලීම් නොමැති නම් නියමිත කාලයට වඩා වුව ද එම ස්ථානයේ සේවය කරන නිලධාරියාට තමා කැමැත්තේ නම් එක දිගටම සිටීමට ඉඩ දිය හැකිය.

(ඇ) නිලධාරියාට මෙන්ම පවුලේ අයට ද ඇතිවන අපහසුතාවන් අවම කිරීමට හැකි වන සේ ස්ථාන මාරු වීමක් ලබා දීමට පහසු වන පරිදි සෑම නිලධාරියෙකු විසින්ම තමා ඉල්ලා සිටින සේවා ස්ථානයකට අමතරව තවත් විකල්ප ස්ථාන දෙකක් ඉල්ලුම් පත්‍රයේ සඳහන් කල යුතුය.

(ඈ) අනිවාර්යය ස්ථාන මාරු නියෝග කිරීමේ දී නිලධාරියා පිළිබඳව පහත කරුණු සලකා බලනු ලැබේ.

I. විවාහක / අවිවාහක බව
II. දූ දරුවන්ගේ වයස් හා අධ්‍යාපන කටයුතු
III. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය
IV. ස්ථිර පදිංචි ගම් ප්‍රදේශය

(ඉ) නිලධාරියාගේ ඉල්ලීම මත හෝ වෙනත් විශේෂිත කරුණු මත මිස අවුරුදු 53 ඉක්ම වූ නිලධාරීන් දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකරන අතර දිස්ත්‍රික්කය තුළ ස්ථාන මාරුවීම් වලට යටත් වන වේ.

(ඊ) එසේම අවුරුදු 53 ඉක්මවා ඇති අවුරුදු 55න් විශ්‍රාම යාම සඳහා විධිමත් පරිදි ඉල්ලීම් ලිපි ඉදිරිපත් කර ඇති නිලධාරීන් වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත් නොවන අතර එසේ විශ්‍රාම යාම් පිළිබඳව තහවුරු කිරීමේ ලිපි ඉදිරිපත් නොකරන නිලධාරීන් අභ්‍යන්තර ස්ථාන මාරු සඳහා යටත් වේ.

(උ) **පරිවාස කාලය අවසන් නොකළ නවක නිලධාරීන් මෙම ස්ථාන මාරුවීම්වලට ඉඩ දෙනු ලබන්නේ දෙපාර්තමේන්තුවේ සේවා අවශ්‍යතාවන්ට අනුකූලවය.**

(ඌ) අභ්‍යන්තර ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන සියලුම නිලධාරීන් තමන්ගේ අයදුම්පත අදාළ අධීක්ෂණ නිලධාරියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(එ) කිසිම හේතුවක් නිසා අයදුම්පත් භාර ගැනීමේ දිනය දීර්ඝ කරනු නොලැබේ.

(ඒ) මෙම චක්‍රලේඛයේ ඇතුළත් කරුණු ඔබ යටතේ සේවය කරන අදාළ සියලුම නිලධාරීන්ගේ දැන ගැනීමට සලස්වා ඔබ වෙත ලැබෙන අයදුම්පත් නියමිත දිනට ප්‍රථම එවීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

04.3 සර්වේයර් ජනරාල් කාර්යාලය, මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය, පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල, දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාල හා ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා අනුයුක්ත කරන ඒකාබද්ධ සේවයට අයත් රාජ්‍ය කළමනාකරණ සහකාර, සංවර්ධන නිලධාරී, කාර්යාල සේවක සේවයේ නිලධාරීන් සංඛ්‍යාව පිළිවෙලින් ඇමුණුම 01, 02, 03 මගින් දක්වා ඇති අතර ඒ අනුව 2020 වර්ෂයේ ස්ථාන මාරුවීම් සඳහා සේවා අවශ්‍යතා හා පුරප්පාඩු ගලපනු ඇත.

<u>සටහන</u> :

01. අභ්‍යන්තර ස්ථාන මාරු අපේක්ෂා නොකරන, සේවා කාලය වසර 05ට වැඩි සියලුම පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කාර්යාලවල ඒකාබද්ධ සේවයට අයත් සියලුම නිලධාරීන් ස්ථාන මාරුවක් ලැබුනහොත් සේවය කිරීමට කැමති ස්ථාන 03 ක් සඳහන් කර එවීමට කටයුතු කරන්න. එම තොරතුරු පළාත් සර්වේයර් ජනරාල් මගින් ඔහුගේ නිර්දේශය සහිතව මා වෙත යොමු කිරීමට කටයුතු කරන මෙන් ද කාරුණිකව දන්වමි.

එස්.එම්.පී.පී.සංගක්කාර
සර්වේයර් ජනරාල්(වැ.බ)

එස්. එම්. පී. පී. සංගක්කාර
සර්වේයර් ජනරාල් (වැ.බ.)
සර්වේයර් ජනරාල් කාර්යාලය
කොළඹ 05.

ඇමුණුම 01

| කාර්යාලය | රා.ක.ස. සංඛ්‍යාව |
|---|---|
| ප්‍රධාන කාර්යාලය | 130 |
| මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය | 15 |
| පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය | 10 |
| දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය | 05 |
| ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය | 01 |

ඇමුණුම 02

| කාර්යාලය | සංවර්ධන නිලධාරී සංඛ්‍යාව |
|---|---|
| ප්‍රධාන කාර්යාලය | 28 |
| මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය | 04 |
| පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය | 02 |
| දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය | 02 |
| ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය | - |

ඇමුණුම 03

| කාර්යාලය | කා.සේ.සේ/ මුරකරු සංඛ්‍යාව |
|---|---|
| ප්‍රධාන කාර්යාලය | 43 |
| මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය | 06 |
| පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය | 02 |
| දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය | 02 |
| ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය | 01 |

# ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරු ඉල්ලුම් පත්‍රය ( දෙපාර්තමේන්තුව තුළ ) 2020
## රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය / ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය/ සංවර්ධන නිලධාරී

01. (අ) දැනට සේවය කරන කාර්යාලය : ..................................................
(ආ) එම කාර්යාලය පිහිටි නගරය : ..................................................

02. (අ) නිලධාරියා / නිලධාරිනියගේ සම්පූර්ණ නම:..................................................
..................................................
(ආ) පෞද්ගලික ලිපිනය ( ස්ථිර පදිංචිය )..................................................
..................................................

03. (අ) උපන් දිනය :- .................................. 2019.12.31 දිනට වයස:- අවු:-...............මාස..............
(ආ) ස්ත්‍රී / පුරුෂ භාවය :- ..............................

04. (අ) කළමනාකරණ සහකාර සේවයට / ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයට ඇතුළත් වීමට පෙර සිටින ලද සේවාව හා එම සේවයට පත් වූ දිනය :-
..................................................
(ආ) දැනට සිටින පන්තිය :- ..................................................

05. (අ) විවාහක අවිවාහක බව :-..................................................

(I) දරුවන් ගණන හා ඔවුන්ගේ වයස් ප්‍රමාණයන් ..................................................
..................................................

(II) පාසල් යන දරුවන් වෙතොත් ඉගෙනුම ලබන පාසල් :- ..................................................
..................................................

(III) කලත්‍රයාගේ නම :- ..................................................
තනතුර :- ..................................................
සේවා ස්ථානය:- ..................................................
පිහිටි නගරය :- ..................................................

(IV) කලත්‍රයා ක්‍රියාන්විත රාජකාරියේ නියුතු නම් ( ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිසියේ ) ඔහු හෝ ඇය අයත් වන සේවය හා තනතුර :- ..................................................
( එය සනාථ කිරීම සඳහා සේවා ප්‍රධානියාගෙන් ලබා ගත් සහතිකයක් අමුණන්න. )

(ආ) දෙපාර්තමේන්තුවේ සේවා කාලය පිළිබඳ විස්තරය
( ඉඩ ප්‍රමාණවත් නොවේ නම් ඇමුණුමක් ඉදිරිපත් කරන්න. )

| සිට | දක්වා | සේවා කාලය | සේවා ස්ථානය | අයත් දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| | | | | |

06.

| නිලධාරියා මාරු වීමට කැමති ස්ථාන 03 ක් කැමැත්ත අනුව අනු පිළිවෙළින් සඳහන් කරන්න | එම සේවා ස්ථාන අයත් දිස්ත්‍රික්කය |
|---|---|
| | |
| | |
| | |

07. ඉල්ලුම් කිරීමට හේතු :-

(i) ........................................................................................................................
........................................................................................................................

(ii) ........................................................................................................................
........................................................................................................................

(iii) ........................................................................................................................
........................................................................................................................

08. ඉල්ලුම් කිරීමට වෙනත් හේතු ඇත්නම් :-

........................................................................................................................
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................
........................................................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය බව ප්‍රකාශ කරමි. එම තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා හට විරුද්ධව විනයානුකූලව කටයුතු කළ හැකි බව දනිමි.

...................................................... ......................................................

දිනය නිලධාරියාගේ අත්සන

---

**අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය**

සර්වේයර් ජනරාල් ,

........................................................................................................................
........................................................................................................................
........................................................................................................................
..........................................................................

දිනය :- ..........................................

අධීක්ෂණ නිලධාරියාගේ අත්සන
තනතුර ( නිල මුද්‍රාව )

# ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරු ඉල්ලුම් පත්‍රය ( දෙපාර්තමේන්තුව තුළ ) 2020

## රියදුරු සේවය / කාර්යාල සේවක සේවය

නිලධාරියා අයත් සේවාව

| රියදුරු සේවය | කාර්යාල සේවක සේවය |
|---|---|
| | |

( ඔබ අයත් සේවාව ඉදිරියෙන් √ ලකුණ යොදන්න. )

01. (අ) දැනට සේවය කරන කාර්යාලය : ..........................................

(ආ) එම කාර්යාලය පිහිටි නගරය : ..........................................

02. (අ) නිලධාරියා / නිලධාරිනියගේ සම්පූර්ණ නම: ..........................................

..........................................

(ආ) පෞද්ගලික ලිපිනය ( ස්ථිර පදිංචිය ) ..........................................

..........................................

03. (අ) උපන් දිනය :- .................................. 2019.12.31 දිනට වයස:- අවු:-..............මාස..............

(ආ) ස්ත්‍රී / පුරුෂ භාවය :- ..............................

04. (අ) දැනට සිටින සේවයට පත්වූ දිනය :- ..........................................

(ආ) දැනට සිටින පන්තිය :- ..........................................

05. (අ) විවාහක අවිවාහක බව :- ..........................................

(I) දරුවන් ගණන හා ඔවුන්ගේ වයස් ප්‍රමාණයන් ..........................................

..........................................

(II) පාසල් යන දරුවන් වෙතොත් ඉගෙනුම ලබන පාසල් :- ..........................................

..........................................

(III) කලත්‍රයාගේ නම :- ..........................................

තනතුර :- ..........................................

සේවා ස්ථානය:- ..........................................

පිහිටි නගරය :- ..........................................

(IV) කලත්‍රයා ක්‍රියාත්විත රාජකාරියේ නියුතු නම් ( ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිසියේ ) ඔහු හෝ ඇය අයත් වන සේවය හා තනතුර :- ..........................................

( එය සනාථ කිරීම සඳහා සේවා ප්‍රධානියාගෙන් ලබා ගත් සහතිකයක් අමුණන්න. )

(ආ) දෙපාර්තමේන්තුවේ සේවා කාලය පිළිබඳ විස්තරය

( ඉඩ ප්‍රමාණවත් නොවේ නම් ඇමුණුමක් ඉදිරිපත් කරන්න. )

| සිට | දක්වා | සේවා කාලය | සේවා ස්ථානය | අයත් දිස්ත්‍රික්කය |
|---|---|---|---|---|
| | | | | |

06.

| නිලධාරියා මාරු වීමට කැමති ස්ථාන 03 ක් කැමැත්ත අනුව අනු පිළිවෙළින් සඳහන් කරන්න | එම සේවා ස්ථාන අයත් දිස්ත්‍රික්කය |
|---|---|
| | |
| | |
| | |

07. ඉල්ලුම් කිරීමට හේතු :-

(i) ..................................................................................................

..................................................................................................

(ii) ..................................................................................................

..................................................................................................

(iii) ..................................................................................................

..................................................................................................

08. ඉල්ලුම් කිරීමට වෙනත් හේතු ඇත්නම් :-

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය බව ප්‍රකාශ කරමි. එම තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා හට විරුද්ධව විනයානුකූලව කටයුතු කළ හැකි බව දනිමි.

..................................................... .....................................................

දිනය නිලධාරියාගේ අත්සන

---

**අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය**

**සර්වේයර් ජනරාල් ,**

..................................................................................................

..................................................................................................

..................................................................................................

..................................................................................................

දිනය :- ..........................................

අධීක්ෂණ නිලධාරියාගේ අත්සන
තනතුර ( නිල මුද්‍රාව )